# 2018 අප්‍රියෙල් මස සාංඝික පවුල් දින සුපුවත

# සංඝය උත්ථාන වූ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ ශ්‍රී ශරීරයයි

01. හැඳින්වීම:

* පාස්කු ඉරුදින ජයග්‍රාහී එතෙරවීමේ මංගල්‍යය දිනයයි. "මම කල්පාන්තය දක්වා සදහටම ඔබ හා සමඟ සිටිමි"යි වදාළ සමිඳාණෝ දැන් අප සමඟය. අප මධ්‍යයෙහි ජීවමානව බලගතුව වැඩ සිටින සේක. (ශු.මතෙව් 28:20)
* ඔවුන් වහන්සේ අපට දුන් පොරොන්දුව විශ්වාස කරමින්, අයිති කරගනිමින් සංඝය එක්රැස් වන තැන ප්‍රකාශ වන සමිඳාණන් වෙත අපගේ නෙත්, සිත් හදවත් යොමු කරමු. ශුද්ධාත්මයාණන් වහන්සේ මේ මොහොතේ ඔබට / මට ඔවුන් වහන්සේව දකින්නට, දැනෙන්නට සලස්වන සේක.
* පළමු කොට ශුද්ධාත්මයාණන් වහන්සේට ගීතිකාවක් ගායනා කරමින් ඔවුන් වහන්සේගේ වැඩසිටීම ඔබට/මට අත්විඳින්නට සලස්වන්න යැයි කියා අයැද සිටිමු.
* පුබුදු ගී 126 "ශුද්ධාත්මයාණෙනි ....

02. ආරම්භක ප්‍රශංසාව සඳහා යොමුව :

i * ශු.ජොහාන් 20:19-20 දක්වා ශු.ලියවිලි පාඨය කියවා එම සුවිශේෂක සිද්ධිය චිත්‍රගත කර ගන්න.

* "සතියේ පළමුවන දා වූ එදා ජුදෙව්වරුන්ට බියෙන් ශ්‍රාවකයෝ දොරවල් වසා ගෙන සිටි තැනට ජේසුස් වහන්සේ වැඩම කර... ශ්‍රාවකයෝ සමිඳාණන් වහන්සේ දුටු කල ප්‍රීතියෙන් පිනා ගියහ.

ii මෙනෙහි කිරීම

* 'ෂාලොම්' - මෙහි අර්ථය නම් ඔබට ශාන්තිය, සෙත,සෞභාග්‍ය, සතුට, ප්‍රීතිය,සාමය අත්වේවා! යන්නයි.
* එකනෙහිම සිදුවුයේ කුමක්ද? ශ්‍රාවකයන් තුළ තිබූ බිය, සැක දුරු වී ගියා. ඔවුන්ගේ සිත් තුළ අමුතු සාමයක්, ප්‍රීතියක් ඇති වුනා. ඇතුලාන්තයේ ලොකු පෙරළියක් සිද්ධ වුනා. පුදුමාකාර නිදහසක් අත්දකින්නට පටන් ගත්තා.
* ක්‍රිස්තුන් වහන්සේගේ අත්ද, ඇලයද ශ්‍රාවකයින්ට පෙන්වන විට .... ඔවුන් සමිඳාණන් ඉදිරියේ **ශස්ඨාංගයෙන්** වැඳ වැටුනා. ප්‍රීතියෙන් පිනා ගියා. ඔවුන්ගේ හදවත් තුළින් ප්‍රීතිය උතුරා ගියා.

iii දැන් දකින්න සංඝය තුළ ප්‍රකාශ වන උත්ථානවූ, ප්‍රථාපවත් වූ, මහිමාලංකාරයෙන් බැබලෙන සමිඳාණන් වහන්සේව.

* නැවත චිත්‍රගත කරන්න...මේ දැන් අප අතර ඔවුන් වහන්සේ බලගතුව වැඩ සිටින අයුරු දකින්න. ඔබත්, මමත් පමණක් නොවේ භාග්‍යවන්ත අම්මාත් සංඝයේ අප සියළු දෙනා අතර සිටින අයුරු දකින්න.
* අපිදු සමිඳාණන් ඉදිරියේ වැඳ වැටී හදවතේ නමස්කාරය පුද කරමු.
* "සමිඳුනී ඔබ දැන් මෙහි ...." (පුබුදු ගී 122)

iv නමස්කාරයෙන් අනතුරුව... ඔවුන් වහන්සේ මැදිකර ගෙන ගැඹුරු ප්‍රශංසාවකට ඇතුළු වෙමු.

* පුබුදු ගී 226 "දුටු සඳින් මා...."

03. මාසික සුපුවත :

(අ) චතාරික භාවනාව තුළ, චතාරික සමය තුළ ඔබගේ එතෙරවීමේ අත්දැකීම කුමක්ද? ළඟ සිටින දෙතුන් දෙනෙකු සමඟ බෙදා ගන්න. ඉන්පසු අත්දැකීම් කිහිපයක් පොදුවේද බෙදා ගන්න.

(ආ) ක්‍රිස්තුන් වහන්සේ ගැළවුම්කරුවාණන් හැටියට, අවසාන සතිය එනම් ශුද්ධවූ සතිය තුළ එතෙරවීමේ අත්දැකීම පිළිබඳව මොහොතක් මෙනෙහි කරමු. ඔවුන් වහන්සේගේ පුත්‍රභාවය දෙස අපගේ නෙත් සිත් හදවත් යොමු කරමු.

i ක්‍රිස්තුන් වහන්සේ ගෙත්සෙමනෙහි සිට කල්වාරි කඳු මුදුනේ කුරුස ගත වූ මොහොත දක්වාම පියාණන් වහන්සේ සමඟ තිබූ සම්බන්ධකම, කිසිදු මොහොතකවත් බිඳුනේ නැත. ඔවුන් වහන්සේ ජෝර්දාන් ගඟෙහිදී අයිති කරගත් ප්‍රසන්න පුත්‍රභාවය කුරුසියේ ගැඹුරු වේදනාත්මක මොහොතේදී පවා අත්දුටු සේක. ගෙත්සෙමනෙහි යාච්ඤාවෙන් පසුවද අත්දුටු හුදකලාව, තනිභාවය, ප්‍රතික්ෂේපය, පැවති අත්දැකීම යන සියල්ල ප්‍රසන්න පුතෙකු සේ පසුකළ සේක. ඉන් එතෙර වු සේක. මුළු මිනිස් සංහතිය සදාකාලික මරණීය තත්ත්වයෙන් එතෙර කරනු වස්, ප්‍රේමයෙන් ස්වකීය කැමැත්තෙන් තම පියාණන්ට මහිමය අත්වන පිණිස සතුටු සිතින් වැළඳ ගත් සේක. කස පහර විඳින විට, කටු ඔටුන්නක් පළඳවන විට කුරුසියේ ගමන පුරාම අන්තිමයා දක්වා ප්‍රේම කළ සේක. එහි ප්‍රතිඵලය වූයේ උත්ථානය කරණ කොට ගෙන මුළු මිනිස් සංහතියම එක් කරනු ලැබීමයි.

ii ඔවුන් වහන්සේට අපගේ අවංක වු හදවතින් නික්ම එන ප්‍රේමය ගෞරවය ප්‍රකාශ කරමින් පුබුදු ගී 61 ගායනා කරමු. "නැගේ හඬක් හදින් මා..."

iii මුළු මිනිස් සංහතිය වෙනුවෙන් ඔබ/මා වෙනුවෙන් කුරුස පාමුල රැඳී සිටි භාග්‍යවන්ත අම්මාගේ අත්දැකීම මොහොතක් මෙනෙහි කරමු.
* එතුමිය ද දේව දියණියක් ලෙස තමකම නසා, තම පුත්‍රයාණන්ගේ අත්දැකීම වැළඳ ගත්තා නොවේද? කුරුසිය මත තම පුතණුවන්ගේ උකුත්වීමත් සමගම, බලාපොරොත්තුවේ අම්මා වීමේ වරය ශුද්ධාත්මයාණන් වහන්සේ කරණ කොට ගෙන ලබා ගත්තාය. භාග්‍යවන්ත අම්මාගේ කුසෙ පාමුල ජීවිත අත්දැකීමෙන් එතුමිය දෙවි සමිඳාණන් කෙරෙහි තිබූ විශ්වාසය, ප්‍රේමය කෙතරම්දැයි මනාව පැහැදිලි වූවා නොවේද?
* අපගේ ගෞරවය එතුමිය වෙත පුද කරමින් අපි ගායනා කරමු පුබුදු ගී 304 "මගේ රතු ලෙය..."

04. අප සංඝයේ පුත්‍රභාවය දෙස :
(අ) සංඝය උතථාන වු ක්‍රිස්තුන් වහන්සේගේ ශරීරය බව අපි දනිමු. ඒ එසේ වන්නේ කෙසේදැයි කුඩා කණ්ඩායම් තුළ ජීවලිතව බෙදා ගන්න. සාකච්ඡා කරන්න, පොදුවේ බෙදා ගන්න.
(ආ) ඉන්පසු 1කොරෙන්ති 12:12-20 දක්වා කියවා ශු.පාවුළු තුමාගෙ අත්දැකීම කුමක්දැයි මෙම ශු.ලියවිලි පාඨය මුල් කරගෙන බෙදා ගන්න.

05. වචනයේ සේවකයා සඳහා :
(අ) * සභාව හෙවත් සංඝය ගැන ශු.පාවුළු තුමාට ශුද්ධාත්මයාණන්ගෙන් ලැබී ඇති ආලෝකය වචනගත කිරීමේදී එතුමා භාවිතා කර ඇති උපමාව නම් මනුෂ්‍ය ශරීරයේ ක්‍රියාකාරීත්වයයි. මනුෂ්‍ය ශරීරයන් දරණ ඔබත්, මමත් මනා ලෙස මිනිස් සිරුරේක්‍රියාකාරීත්වය හඳුනා ගෙන සිටිමු.
* එහි ක්‍රියාකාරීත්වය හා එක එක අවයවයට හිමි තැනත්, එමෙන්ම මුළු ශරීරයම එකම අරමුණක් හා පැවැත්මක් සඳහා ක්‍රියා කරන බ ව මනා ලෙස පෙනේ.
* සංඝය ක්‍රිස්තුන් වහ්සේගේ ශරීරය බැවින් එක එක අවයවයට නියමිත කාර්යයක් ඇත. හිස තුළ ඇති මොලයෙන් ලැබෙන විධානයට හැම අවයවයක්ම කීකරුව කටයුතු කරයි. සිතන්න.... එසේ නොවුවොත් කුමක් සිදුවෙයිද ශරීරයට? ශරීරයේ පැවැත්මට? ශරීරය පුරා රුධිරය බෙදා හැරීමේ නාලිකා නියමාකාරයෙන් ක්‍රියාත්මක නොවුවොත් ශරීරයේ පැවැත්මට කුමක් සිදුවෙයිද?
* ශු.පාවුළුතුමා දුබලකමින් පිරුණු මිනිසුන්ගෙන් සැදුම් ලත් සංඝය දකින්නේ ක්‍රිස්තුන් වහන්සේගේ ශරීරය ලෙසයි.
* ක්‍රිස්තු ශරීරය ලෙස සංඝ වැඩි වර්ධනය වන්නේ එහි හිස වන උත්ථානවූ ක්‍රිස්තුන් වහන්සේ හා අපි ඒකාබද්ධ වන ප්‍රමාණයටයි.

(ආ) අපි අපි සිටින තත්ත්වයට අවදි වෙමු. ඔබගේ / මගේ දූත කාර්යයට අවදි වෙමු. මම ක්‍රිස්තුන් වහන්සේගේ අතින්ද්‍රිය ශරීරයේ අවයවයක් වෙමි. ඒ සඳහා මා කැඳවා ඇත. එසේ නම් මම කෙසේ ක්‍රියා කළෙම්ද? සංඝය නැමැති ශරීරයේ පැවැත්ම දුර්වල වෙන්නට මා දායක විද?

* නැවත නැවතත් ඔවුන් වහන්සේ ඉදිරිපිට වැඳ වැටී සමාව අයදිමු.... මනස්ථාපනය වෙමු.
* උත්ථානයෙ බලය අතදකිමින්, සාක්ෂි කරුවෙක් වීමේ මහඟු ප්‍රීතිය භුක්ති විඳිමු. ඔවුන් වහන්සේගේ විජග්‍රහණයේ හිමිකරුවන් වීමේ සතුට, ප්‍රීතිය බෙදා ගනිමු. ක්‍රිස්තු ශරීරයේ අවයවයන් වීමේ අනුග්‍රහය ගැන අන් අය සමඟ බෙදා ගනිමු. ඔවුන්ද ඊට අවදි කරමු.
* ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ අපගේ එකම සමිඳාණන් වහන්සේ වන සේක. අපි ඔවුන් වහන්සේගේ ස්වාමිත්වය පිළිගෙන ක්‍රිස්තුන් වහන්සේගේම උත්ථානයේ සාමය, ප්‍රිතිය, බලය අපි එකිනෙකා සමඟ බෙදා ගනිමු. එකිනෙකාට ෂාලොම් ප්‍රාර්ථනා කරන්න.

05. අවසාන යාච්ඤාව :

පුබුදු ගී 192 "ඔසවමි ඔබ වෙත ...."

**************************